(34)

Article 11

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 19th July 2021 |

පැමිණිලි පාර්ශවය : ඩබ්ලිව්.එම්.පී. විජයසුන්දර මිය.
බුදු මැදුර අසල, පලන්සූරියගම,
කහවත්ත.

වගඋත්තර පාර්ශවය :

1. පො.ප. - බී.ජේ.පී. බමුණුසිංහ මයා,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
රක්වාන.

2. කා.පො.කො. 9524 පී.ඩබ්ලිව්.එස්.එම්. පෙරේරා මිය,
පොලිස් ස්ථානය,
රක්වාන.

3. කා.පො.සැ. 1833 ඩබ්ලිව්.පී.යූ. ශ්‍යාමලී මිය,
පොලිස් ස්ථානය,
රක්වාන.

4. කා.පො.කො. 6985 එන්.එච්.පී.යූ.සී. කුමාරි මිය,
පොලිස් ස්ථානය,
රක්වාන.

5. උ.පො.ප. එච්.ප්‍රේමානන්ද මහතා,
ස්ථානාධිපති, විවිධ පැමිණිලි අංශය,
පොලිස් ස්ථානය, රක්වාන.

6. පො.කො.60232 එන්.ජේ.එච්.ඩබ්ලිව්.වසන්ත කුමාර මයා,
පොලිස් ස්ථානය,
රක්වාන.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com

*පැමිණිලි අංකය : HRC/1697/18*

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තම ස්වාමි පුරුෂයා මියගොස් ඇති අතර, ස්වාමි පුරුෂයාගේ සහෝදරයෙක් සමග ඉඩම් ආරවුලක් පවතින බවත්, 2018.04.01 වන දින පැමිණිලිකාරිය තේ වත්ත සුද්ධ කරන විට ආරවුල පවතින ඥාතියෙක් පරුෂ වචනයෙන් බැණ වැදුනු බැවින්, පැමිණිලිකාරිය 119 අංකයට ඇමතුමක් ලබා ගැනීමෙන් පසුව පොලිසියෙන් එම ස්ථානයට පැමිණි බවත්ය. එක් නිලධාරියෙක් පැමිණිලිකාරියගේ නිවසට පැමිණ විස්තරය සටහන් කර ගත් බවත්, අනෙක් නිලධාරියා අනෙක් පාර්ශවයේ නිවසට ගිය බවත් සඳහන් කර ඇත. පසුව 2018.07.06 වන දින තමා සේවය කරන ග්‍රාමසේවක කාර්යාලයට පෙරවරු 10.30 ට පමණ දුරකථන ඇමතුමක් ලබාදී පැමිණිල්ලක් විභාග කිරීම සඳහා 2018.07.08 වන දින උදේ 10.00 ට පොලිස් ස්ථානයට පැමිණෙන ලෙසට දැනුම්දුන් බවත්, ඒ අනුව තමා එදින පෙරවරු 9.58 ට පමණ රක්වාන පොලිස් ස්ථානයට ගොස් පිළිගැනීමේ නිලධාරියා හමුවී තමාට පැමිණිල්ලක් කිරීමට අවශ්‍ය බවට ප්‍රකාශ කළ බවත්, එවිට එම නිලධාරියා පැමිණිල්ලක් සටහන් කරමින් සිටි නිසා ටික වේලාවක් වාඩිවී සිටින ලෙසට තමාට දැන්වූ බවත් සඳහන් කර ඇත.

පසුව පැමිණිලිකාරිය සුළු පැමිණිලි අංශයට ගොස් පැමිණිල්ලක් දැමීමට අවශ්‍ය බවට සඳහන් කළ විට 'පැමිණිල්ලක් විභාග කිරීමට තිබෙන නිසා අනෙක් පාර්ශවය එනතෙක් රැඳී සිටින ලෙස' එම නිලධාරියා විසින් පවසන ලද බවත්, පසුව අනෙක් පාර්ශවයේ සෙනෙවිරත්න නැමති ගුරුවරයා පැමිණ ස්ථානාධිපතිවරයාගේ කාර්යාලයට ගිය බවත්, තමා ද ස්ථානාධිපතිවරයාගේ කාර්යාලයට ගොස් "සමාවෙන්න මහත්තයා" කියා ප්‍රකාශ කළ බවත්, එවිට ඔහු තමාගෙන් "මොකටද සමාවෙන්න කියන්නේ" කියා ඇසූ බවත්, එවිට පැමිණිලිකාරිය "නැත්නම් රාජකාරියට බාධා කළා කියලා චෝදනා කරනවනේ" කියා ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. ඉන්පසුව ස්ථානාධිපතිවරයා නිලධාරින්ට "ඔය ගෑනිව අල්ලලා මාංචු දමන්න" යැයි දැනුම්දුන් බවත්, එවිට පැමිණිලිකාරිය ස්ථානයෙන් පිටවීමට සූදානම් වූ විට එම ස්ථානයේ සිටි පොලිස් නිලධාරියෙක් තමාව අල්ලා ගත් බවත්, බමුණුසිංහ නැමති නිලධාරියා තමාගේ කණට පහරක් ගැසූ බවත්, කාන්තා පොලිස් නිලධාරිනියන් පැමිණ වට කර අල්ලා ගත් බවත් සඳහන් කර ඇත. පසුව මාංචු දැමූ බවත් පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

අනතුරුව පැමිණිලිකාරිය ජංගම දුරකථනයෙන් සහකාර පොලිස් අධිකාරිවරයාට ඇමතුමක් ලබාගත් බවත්, එය දැක එම දුරකථනය ඉල්ලා පොලිස් නිලධාරින් පැමිණිලිකාරියට පහරදුන්

133

බවත් සදහන් කර ඇත. පසුව පැමිණිලිකාරියව 2018.07.09 වන දින රක්වාන මහේස්ත්‍රාත් අධිකරණයට බී අංක 357/18 යටතේ ඉදිරිපත් කළ බවත්, පැමිණිලිකාරියගේ උඩුකය තුළ තබාගෙන සිටි දුරකථනය කාන්තා නිලධාරිනියක් අත දමා ගත් බවත්, පොලිස් නිලධාරිනියන් පහරදුන් බවත් සදහන් කරන අතර, පැමිණිලිකාරියගෙන් ප්‍රකාශයක් සටහන් කර එම ප්‍රකාශයට අත්සන් කරන ලෙසට දැන්වූ බවත්, ඇස් කණ්නාඩි නොමැති බැවින් අත්සන් කිරීමට නොහැකි බවට දැනුම්දුන් විට ස්ථානාධිපතිවරයා විසින් තමාට බැණ වැදුනු බවත් පැමිණිල්ලේ සදහන් කර ඇත. පසුව මාංචු දමා අධිකරණයට රැගෙන ගිය බවත්, එසේ යන අතරතුරදී කාන්තා පොලිස් නිලධාරිනියක් පහරදුන් බවත්, ඒ අවස්ථාවේදී පැමිණිලිකාරිය පොලිස් නිලධාරිනියගේ අත සපා කෑ බවත් පැමිණිල්ලේ දක්වා ඇත. අධිකරණය විසින් පැමිණිලිකාරිය බන්ධනාගාර ගත කළ බවත්, පසුව ඇප මත නිදහස් වී රත්නපුර රෝහලෙන් ප්‍රතිකාර ලබා ගත් බවත් සදහන් කර ඇත.

**පැමිණිල්ලේ සාක්ෂි :-**

පැමිණිලිකාරිය පැමිණිල්ල තහවුරු කිරීම සදහා වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත. අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පැමිණිලිකාරිය 2018.07.09 වන දින රෝහලට ඇතුලත් කර ඇති අතර, 2018.07.11 වන දින අධිකරණ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කර ඇත. වෛද්‍ය වාර්තාව අනුව බරපතල නොවන තුවාල 05 ක් ඇති බවට සදහන් වේ.

**වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

පැමිණිල්ල සම්බන්ධයෙන් ස්ථානාධිපති, රක්වාන විසින් වාර්තාවක් සපයා ඇති අතර, එම වාර්තාව අනුව 2018.04.04 වන දින පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් අනුව විමර්ශනයක් සිදුකිරීමට නිලධාරින් දෙදෙනෙක් අදාළ ස්ථානය වෙත ගිය බවත්, එදින දෙපාර්ශවය එම ස්ථානයේ නොසිටි බවත්, ඒ අනුව 2018.04.31 වන දින පැමිණිල්ලේ වැඩිදුර විමර්ශනයක් සදහා පොලිස් නිලධාරින් දෙදෙනෙක් එම ස්ථානයට ගිය බවත්, ඒ අවස්ථාවේදී පැමිණිලිකාරිය එම නිලධාරියාගේ රාජකාරියට බාධා කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් ස්ථානයට වාර්තා කිරීමෙන් පසුව ඒ පිළිබඳව අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් පසු පැමිණිලිකාරියව අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට අධිකරණය විසින් නියෝග කර ඇති බවත් දක්වා ඇත.

ඒ අනුව 2018.07.08 වන දින ප්‍රියන්තා විජේසුන්දර යන අය පොලිසියට පැමිණීමෙන් පසුව පොලිස් නිලධාරියෙකුට සාපරාධී බලහත්කාරය පෑම, බැණ වැදීම, තර්ජනය කිරීම සහ රාජකාරියට බාධා කිරීම යන චෝදනා වලට ඇයව අත්අඩංගුවට ගෙන ඇති අතර, ඇයව බංකුවේ වාඩිකරන ලෙසට ස්ථානාධිපතිවරයා විසින් උපසේවා නිලධාරියාට උපදෙස් දුන් බවද

සදහන් කර ඇත. එහිදී කා.පො.කො. 9524 පෙරේරා නිලධාරිනියගේ අත සපා කා පැමිණිලිකාරිය පලායාමට උත්සාහ කිරීම නිසා කා.පො.කො. 1833 හන්සමාලි හා කා.පො.කො. 6985 කුමාරි යන නිලධාරිනියන් වෙත ඇයව අත්අඩංගුවට ගෙන අත් විලංගු දමා රදවා තබා ගන්නා ලෙසට ස්ථානාධිපතිවරයා විසින් නියෝග කළ බව සදහන් කර ඇත. මෙම පැමිණිලිකාරිය විසින් අත සපා කෑ කා.පො.කො. 9524 පෙරේරා නිලධාරිනියගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන අධිකරණ වෛද්‍ය පෝරම අංක : 172/18 යටතේ රක්වාන දිසා රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද බවත් සදහන් කර ඇත. අත්අඩංගුවට ගත් තැනැත්තිය 2018.04.30 වන දින පොලිස් නිලධාරියෙකුට සාපරාධ බලහත්කාරය පාමින් පොලිස් නිලධාරියෙකුට රාජකාරියට බාධා කිරීම යටතේ සහ 2018.07.08 දින කාන්තා පොලිස් නිලධාරිනියකගේ අත සපා කෑම සහ අධිකරණයට ඉදිරිපත් කිරීම සදහා පැමිණිලිකාරිය රැගෙන යන අවස්ථාවේදී තවත් කාන්තා නිලධාරිනියකගේ අත සපා කෑම යටතේ අධිකරණය වෙත ඉදිරිපත් කර නඩු පවරා ඇති බව සදහන් කර ඇත.

වගඋත්තරකාර පො.ප. බී.ජ්.ජී. බමුණුසිංහ යන අය කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශයක් ලබාදෙමින් සදහන් කර ඇත්තේ, මෙම පැමිණිලිකාරිය හා තවත් පාර්ශවයක් එකම දිනයේදී කරන ලද පැමිණිලි දෙකක් විභාග කිරීම සදහා පො.කො. 60232 වසන්ත යන නිලධාරියා 2018.04.30 දින අදාළ ස්ථානයට පිටත් කළ බවත්, එම පැමිණිල්ල විභාග කරන අවස්ථාවේදී මෙම පැමිණිලිකාරිය දුරකථනයෙන් තමාට ඇමතුමක් ලබාදී එම නිලධාරියාට පැමිණිල්ලක් විභාග කළ හැකිදැයි තමාගෙන් විමසූ බවයි. මෙම පැමිණිලිකාර කාන්තාව ආවේගශීලිව කථා කළ බව සදහන් කරන අතර, පසුව විමර්ශනයට ගිය නිලධාරින් තමාට දුරකථන ඇමතුමක් ලබාදී පැමිණිල්ල විභාග කිරීමට පැමිණිලිකාරිය බාධා කරන බවත්, බැණවදින බවත් දැනුම්දීමෙන් අනතුරුව ආරවුල් ඇති නොකර නැවත ස්ථානයට පැමිණෙන ලෙස තමා එම නිලධාරින්ට උපදෙස් ලබාදුන් බවත් සදහන් කර ඇත. ඒ අනුව 2018.07.02 වන දින 357/18 යටතේ පැල්මඩුල්ල මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කළ බවද දක්වා ඇත.

මෙම පැමිණිලිකාරිය 2018.07.08 වන දින පැය 10.40 ට පමණ පොලිස් ස්ථානයට පැමිණ පැමිණිල්ලක් කිරීමට අවශ්‍ය බවට දැනුම්දුන් බවත්, ඇයගේ පැමිණිල්ල සටහන් කර ඉන්පසුව ඇයට විරුද්ධව ඇති චෝදනාවට අත්අඩංගුවට ගෙන බංකුවේ වාඩි කරන ලෙසට තමා විසින් කා.පො.කො. 9524 පෙරේරා යන නිලධාරිනියට උපදෙස් දුන් බවත්, එවිට පැමිණිලිකාරිය කාන්තා පොලිස් නිලධාරිනියකගේ අත සපා කා පැන යාමට උත්සාහ කරන අවස්ථාවේදී එම වරද කියාදී ඇයව අත්අඩංගුවට ගත් බවද දක්වා ඇත. පසුව ඇයගේ ප්‍රකාශයක් සටහන් කළ අතර, එය අත්සන් කිරීමට ඇය ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව සපා කෑමෙන් තුවාල වූ නිලධාරිනියගෙන් ප්‍රකාශයන් සටහන් කරගෙන ඇයව අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර සැකකාරියව අධිකරණයට ඉදිරිපත් කිරීම සදහා කාන්තා පොලිස් නිලධාරිනියන් දෙදෙනෙක් සහ නිලධාරියෙක්

සමග පොලිස් ජීප් රථයෙන් අධිකරණයට රැගෙන ගිය බවත් එසේ යන අතරමගදී සැකකාරිය ඇයගේ ආරක්ෂාවට ගිය නිලධාරිනියගේ ද අත සපා කා ඇති බවත්, එම වරද සම්බන්ධයෙන් ද ඇයට විරුද්ධව අධිකරණයට කරුණු වාර්තා කළ බවත් සඳහන් කර ඇත. කිසිදු අවස්ථාවක පැමිණිලිකාරියට පහරදීමක් සිදු නොකළ බවද, පහරදීම සම්බන්ධයෙන් කරන චෝදනා ප්‍රතික්ෂේප කරන බව ද වගඋත්තරකරු සඳහන් කර ඇත.

දෙවන වගඋත්තරකාරිය වන කා.පො.කො. 9524 පී.ඩබ්ලිව්.එස්.එම්. පෙරේරා නිලධාරිනිය කොමිෂන් සභාව ඉදිරියේ කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, 2018.07.08 වන දින තමා පිළිගැනීමේ නිලධාරිනියක වශයෙන් සේවය කළ බවත්, පැය 10.30ට පමණ තමා පැමිණිල්ලක් සටහන් කරමින් සිටින විට මෙම පැමිණිලිකාරිය පැමිණ පොලිසිය කෙරෙහි මහජන අප්‍රසාදය ඇති වන ආකාරයට බැණ වදිමින් සිටි නිසා ඇයගෙන් පොලිසියට ආවේ ඇයි දැයි ඇසූ විට පැමිණිල්ලක් කිරීමට අවශ්‍ය බව සඳහන් කළ බවත්, තමා පැමිණිල්ලක් සටහන් කරමින් සිටින නිසා එය අවසන් කිරීමෙන් පසුව පැමිණිලිකාරියගේ පැමිණිල්ල සටහන් කළ හැකි බවට ඇයට දැනුම් දුන්නද, ඇය ආවේගශීලීව හැසිරුනු බැවින් තමා විසින් ඒ සම්බන්ධයෙන් ස්ථානාධිපතිවරයාට දැනුම්දුන් බවත් සඳහන් කර ඇත. තමා ස්ථානාධිපතිවරයාගේ කාර්යාලයට යන අවස්ථාවේදී පැමිණිලිකාරියද තමා පිටුපසින් පැමිණ ස්ථානාධිපතිවරයාට උස් හඬින් පැමිණිල්ලක් කිරීමට අවශ්‍ය බවට දැන්වූ විට පැමිණිලිකාරියගේ පැමිණිල්ල ද සටහන් කර ඇයට විරුද්ධව ඇති චෝදනා සම්බන්ධයෙන් ඇයව අත්අඩංගුවට ගන්නා ලෙසට ස්ථානාධිපතිවරයා තමාට උපදෙස් ලබාදුන් බවත් සඳහන් කර ඇත. එවිට පැමිණිලිකාරිය කලබල වී පොලිස් ස්ථානයෙන් පැන යන අවස්ථාවේදී තමා පිටුපසින් ගොස් අල්ලා ගත් විට පැමිණිලිකාරිය ඇයගේ අත ගසා දමා යන අවස්ථාවේදී තමා නැවතත් ඇයව අල්ලා ගත් බවත්, පැමිණිලිකාරිය ඇයට පහරදී තමාගේ වම් අතේ මැණික් කටුවට පහලින් සපා කෑ බවත් සඳහන් කර ඇත. අනතුරුව 1833 ශ්‍යාමලී සහ 6985 කුමාරි යන අයගේ සහයෙන් පැමිණිලිකාරියව අත්අඩංගුවට ගෙන විලංගු දමා බංකුවේ වාඩි කළ බවත්, පසුව තමා රක්වාන රෝහලට ගොස් ප්‍රතිකාර ලබාගත් බවත්, කිසිදු අවස්ථාවක පැමිණිලිකාරියට පහර නොදුන් බවත් සඳහන් කර ඇත.

තුන්වන වගඋත්තරකාර කා.පො.සැ. 1833 ඩබ්ලිව්.ජී.යූ. ශ්‍යාමලී යන අය කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, 2018.07.08 වන දින උදේ 10.30 ට පමණ ස්ථානාධිපතිවරයා තමාට කථා කළ බවත්, තමාත් කුමාරි නැමති නිලධාරිනියත් එම ස්ථානයට යන විට පැමිණිලිකාරිය ආවේගශීලීව කෑ ගැසූ බවත්, පසුව ඇය අල්ලා අත් විලංගු දමා බංකුවේ වාඩි කළ බවත්ය. එවිට පෙරේරා නිලධාරිනිය මෙම කාන්තාව ඇයගේ අත සපා කෑ බවට දැනුම්දුන් බවත්, ඒ අනුව ඇයගෙන්ද ප්‍රකාශයක් සටහන් කරගෙන ඇයව වෛද්‍යවරයා වෙත යොමු කළ බවත්, සැකකාරියගෙන් ද ප්‍රකාශයක් ලබාගෙන අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට යන අස්ථාවේදී ඇය

කලහකාරි ලෙස හැසිරුනු බවත්, එවිට තමා සහ කා.පො.කො 6985 කුමාරි ඇයව අල්ලා වාඩිකරන අවස්ථාවේදී කුමාරි නැමති නිලධාරිනියගේ අතද සපා කෑ බවත්, සැකකාරියව අධිකරණයට ඉදිරිපත් කර පසුව කුමාරි නිලධාරිනියගෙන් ද ප්‍රකාශයන් සටහන් කර ඇයවද අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළ බවත්ය. පැමිණිලිකාරියට කිසිදු අවස්ථාවක පහරදීමක් නොකළ බවත් සඳහන් කර ඇත.

හතරවන වගඋත්තරකාරිය වන කා.පො.කො. 6985 එන්.එච්.පී.යූ.සී.කුමාරි යන අය ප්‍රකාශ කර ඇත්තේ, 2018.07.08 වන දින රථ වාහන අංශයේ රාජකාරි කරමින් සිටියදී පෙරවරු 10.40 ට පමණ උපසේවා නිලධාරියා පැමිණ ස්ථානාධිපතිවරයා කථා කරන බව පවසා සිටි බවත්, ඒ අනුව ශ්‍යාමලී යන නිලධාරිනිය සමග ස්ථානාධිපතිවරයාගේ කාමරයට ගිය බවත්, ඒ අනුව සැකකාරිය පෙරේරා නිලධාරිනියගෙන් මිදී පලා යාමට උත්සාහ කළ විට ඇයව අත්අඩංගුවට ගෙන බංකුවේ වාඩි කරන ලෙසට ස්ථානාධිපතිවරයා දැනුම්දුන් බවත්, ඒ අනුව අත්අඩංගුවට ගෙන බංකුවේ වාඩි කර අත්විලංගු දැමීමට සුදානම් වනවිට සැකකාරිය පෙරේරා නිලධාරිනියගේ අත සපා කෑ බවත්ය. පසුව ශ්‍යාමලි නිලධාරිනිය සැකකාරිය පරීක්ෂා කර ඇය භාරයේ තිබූ දේපළ භාරගත් බවත්, තමා සුපුරුදු පරිදි රථ වාහන අංශයේ සේවයට ගිය බවත්, පසුව සැකකාරිය අධිකරණයට ඉදිරිපත් කිරීමට යන ලෙසට කරන ලද දැනුම්දීම අනුව පොලිස් ජීප් රථයෙන් ශ්‍යාමලි නිලධාරිනිය සමග පො.කො. 41737 උබයරත්න නිලධාරියා සහ පො.කො.රි. 80999 විරාජ් සමග ජීප් රථයෙන් සැකකාරිය අධිකරණයට ඉදිරිපත් කිරීමට යන අවස්ථාවේදී ඇය ජීප් රථය තුළ ද කලහකාරි ලෙස හැසිරුනු බවත්, එය නවත්වා ඇයව සීට් එකේ වාඩිකරවීමට තමා උත්සාහ කළ විට සැකකාරිය තමාගේ අතද සපා කෑ බවත්, පසුව ඇයව අධිකරණයට ඉදිරිපත් කළ බවත්, කිසිදු පහරදීමක් නොකළ බවත් සඳහන් කර ඇත.

පස්වන වගඋත්තරකාර උ.පො.ප. ප්‍රේමානන්ද මහතා ප්‍රකාශ කර ඇත්තේ, 2018.07.08 වන දින පැය 10.30 ට තමා විවිධ පැමිණිලි අංශයේ සේවය කරමින් සිටියදී මෙම පැමිණිලිකාර ග්‍රාම නිලධාරිනිය තම අංශයට පැමිණ පැමිණිල්ලක් දැමීමට අවශ්‍ය බව පැවසූ බවත්, එවිට තමා පැමිණිලි සටහන් කරන්නේ පිළිගැනීමේ නිලධාරිනිය බැවින් එතනට යන ලෙසට දැනුම් දුන් බවත්ය. තමා පැමිණිලිකාරිය අත්අඩංගුවට ගැනීමට සහභාගි නොවූ බවත්, මෙම සිද්ධිය තමා නොදුටු බවත්, එසේම පැමිණිලිකාරියට කිසිදු විටක තමා පහරදීමක් නොකළ බවත් සඳහන් කර ඇත.

දෙවන වගඋත්තරකාරියගේ අධිකරණ වෛද්‍ය වාර්තාව ද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර, එහි සපාකෑමෙන් සිදු වූ තුවාල දෙකක් ඇති බව සඳහන් වන අතර, රෝගියාගේ ඉතිහාසය බැහැර කළ නොහැකි බවට සඳහන් කර ඇත.

(13)

හතර වන වගඋත්තරකාරිගේ අධිකරණ වෛද්‍ය වාර්තාව ඉදිරිපත් කර ඇති අතර, එහිද සපාකෑමෙන් වූ තුවාල දෙකක් ඇති අතර, අධිකරණ වෛද්‍යවරයාගේ මතය වී ඇත්තේ රෝගියාගේ ඉතිහාසය බැහැර කළ නොහැකි බවයි.

**නිරීක්ෂණ :-**

2018.07.08 වන දින පැමිණිල්ලක් විභාග කිරීම සඳහා පැමිණිලිකාරියව පොලිසියට කැඳවා ඇති අතර, දෙවන වගඋත්තරකාරියගේ කරුණු දැක්වීමට අනුව පැමිණිලිකාරිය පොලිසියෙන් පැන යනවිට අතින් ඇල්ලූ විට අත සපා කෑ බවට සඳහන් කර ඇත.

තුන්වන සහ හතරවන වගඋත්තරකරුවන් සඳහන් කරන්නේ අත් විලංගු දැමීමට සූදානම් වනවිට අත සපා කෑ බවයි. නමුත් පැමිණිලිකාරිය කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, ඇයගේ ජංගම දුරකථනය ඇගේ සඟවා සිටින අවස්ථාවේදී එය ගැනීමට ඇග තුළට අත දමන විට අත සපා කෑ බවයි.

මේ අනුව දෙවන වගඋත්තරකාරියගේ ප්‍රකාශයේ නොගැළපීම් දක්නට ඇති බව නිරීක්ෂණය වේ. කෙසේ වෙතත් පැමිණිලිකාරිය දෙවන වගඋත්තරකාරියගේ අත සපා කෑ බවට පිළිගෙන ඇති බව නිරීක්ෂණය වේ. අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව එය තවදුරටත් තහවුරු වේ.

පැමිණිලිකාරියට පහරදුන් බවට කරන ලද චෝදනාව සම්බන්ධයෙන් නිරීක්ෂණය වන්නේ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව බරපතල නොවන තුවාල 5 ක් ඇති බවත්, එය රෝගියාගේ කෙටි ඉතිහාසය අනුව ගැළපෙන බවත්ය. ඒ අනුව අධිකරණ වෛද්‍ය වාර්තාවෙන් පෙන්නුම් කරන්නේ වගඋත්තරකාරියන් විසින් පැමිණිලිකාරියට විරුද්ධව බලය යෙදීමක් සිදුකර ඇති බවයි.

තුන්වන වගඋත්තරකාරියගේ ද අත සපා කා ඇති බවට පැමිණිලිකාරිය සඳහන් කරන අතර, ඇය එසේ සිදුකරනු ලැබුවේ අධිකරණයට රැගෙන යනවිට ඇයට අමානුෂික ලෙස පහරදුන් නිසා බව ද සඳහන් කර ඇත. පැමිණිලිකාරියට විරුද්ධව මෙම සිද්ධියට පෙර එනම්, 2018.04.31 වන දින නිලධාරියෙක්ට සාපරාධී බලහත්කාරය පෑම සහ රාජකාරියට බාධා කිරීම යටතේ 2018.07.02 වන දින අධිකරණයට කරුණු වාර්තා කර තිබූ බව ද නිරීක්ෂණය වේ.

මෙම පැමිණිලිකාරියට විරුද්ධව පැල්මඩුල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක : 80073 යටතේ පොලිස් නිලධාරීන් දෙදෙනෙකුගේ අත සපාකෑම සම්බන්ධයෙන් චෝදනා ගොනු කර ඇති බව ද නිරීක්ෂණය වේ.

ඉහත නිරීක්ෂණ අනුව පෙනියන්නේ මෙම පැමිණිලිකාරිය අවස්ථා දෙකකදී පොලිස් නිලධාරීන් දෙදෙනෙකුගේ අත සපා කා ඇති අතර, එම නිලධාරීන් දෙදෙනාට වෛද්‍ය ප්‍රතිකාර ලබාදී ඇති බවයි. ඒ අනුව රජයේ නිලධාරියෙකුට සාපරාධී බලහත්කාරය පෑම සහ රජයේ නිලධාරියෙකුට තුවාල සිදු කිරීම යන කරුණු මත පැමිණිලිකාරියට විරුද්ධව චෝදනා ගොනු කළ හැක.

කෙසේ වුවද පැමිණිලිකාරියගේ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව බරපතල නොවන තුවාල 05 ක් ඇති බවට සඳහන් වීම තුළින් වගඋත්තරකරුවන් පැමිණිලිකාරියට එරෙහිව බලය යෙදවීමක් සිදුකර ඇති බවට තහවුරු වේ. වගඋත්තරකරුවන් පැමිණිලිකාරිය මෙල්ල කිරීමට බලය යෙදවූ බවට සඳහන් කළ ද, බලය යෙදවීමේ ප්‍රමාණය පිළිබඳ විස්තර කිරීමට අපොහොසත් වී ඇත.

එසේම, රජයේ නිලධාරියෙකුගේ රාජකාරියට එරෙහිව ආත්මාරක්ෂාවේ අයිතිය පාවිච්චි කිරීමට පුරවැසියෙකුට නීතියෙන් හිමිකමක් ලබාදී නැති බැවින්, පැමිණිලිකාරිය වගඋත්තරකරුවන්ට තුවාල සිදුකිරීම අපරාධමය වරදක් වේ.

ඉදිරිපත් වී ඇති කරුණු වලට අනුව පළමු අවස්ථාවේදී ද පැමිණිලිකාරිය පොලිස් නියෝග මත හා පොලිසියෙන් පිටවීමට යාමේදී වගඋත්තරකරුවන් බලය යොදවා ඇයව නවතාගෙන ඇති අතර, ඒ අවස්ථාවේදී පළමු සපාකෑම සිදුකර ඇත. එසේම, පැමිණිලිකාරියව අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට රැගෙන යන අවස්ථාවේදී නැවත වතාවක් ඇය විසින් පොලිස් නිලධාරීන් සපා කෑමට ලක් කර ඇත.

එම අවස්ථා වලදී වගඋත්තරකරුවන් බලය යෙදීම මගින් පැමිණිලිකාරියට තුවාල සිදුවූ බවට නිරීක්ෂණය වේ. ඒ අනුව වගඋත්තරකාර පොලිස් නිලධාරීන් විසින් පැමිණිලිකාරියගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකමක් වන 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් නිගමනයට පැමිණිය නොහැකි වේ.

කෙසේ වෙතත්, මෙවැනි අවස්ථාවක එනම්, ආවේගශීලීව හැසිරෙන පුද්ගලයින් සම්බන්ධයෙන් රාජකාරි කිරීමේදී එම අයව පාලනය කිරීම සඳහා බලය පාවිච්චි කිරීමේදී එම තැනැත්තන්ට හානි නොවන ආකාරයට කටයුතු කිරීමට වගඋත්තරකරුවන් වගබලා ගත යුතුව පවතින බව කොමිෂන් සභාව වගඋත්තරකරුවන් වෙත අවධානරණය කර සිටිමු.

130

නිර්දේශය =:

ඒ අනුව කලහකාරීව හැසිරෙන යම් සැකකරුවෙකු හෝ සැකකාරියක පාලනය කිරීම සඳහා යොදවනු ලබන අවශ්‍ය බලය යෙදවීමේ තත්වයන් හා ප්‍රමාණයන් සම්බන්ධයෙන් නිවැරදි අවබෝධයක් පොලිස් නිලධාරින් වෙත ලබා දීමට අවශ්‍ය දැනුවත් කිරීමේ පියවර ගන්නා ලෙසට පොලිස්පතිවරයා වෙත සහ අධ්‍යක්ෂ (නීති) පොලිස් නීති කොට්ඨාශය වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karuna...
Commissioner
Human Rights Commission of ...

පිටපත :- 01. පොලිස්පති.
පොලිස් මූලස්ථානය.
කොළඹ 01.

02. අධ්‍යක්ෂ (නීති)
පොලිස් නීති කොට්ඨාශය.
පොලිස් මූලස්ථානය.
කොළඹ 01.

B/